# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2417/17 - 2024 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2024.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 3/2013(ii)

### 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්
සේවා අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2024 අංක 04 දරන වෙළඳ නැව් (දේශීය මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

*මේ නියෝගවල අදාළත්වය*

**2.** (1) මේ නියෝගයේ (2) වන සහ (3) වන අනු නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග, 2024 දෙසැම්බර් මස 31 අංක 2417/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2024 වෙළඳ නැව් (ජල තීරයන් වර්ගීකරණය කිරීමේ) නියෝගවල නිශ්චිතව දක්වා ඇති "0R", 1, 2, 3, 4 සහ 5 යන වර්ගවල අයත් ප්‍රදේශ තුළ මුහුදු ගමන්වල යෙදෙනට :-

(*අ*) මීටර් විසිහතරක් හෝ ඊට වැඩි දිගකින් යුතු නෞකා;

(*ආ*) දළ ටොන් අසූවකට නොඅඩු සහ දළ ටොන් තුන්දහසකට නොවැඩි නෞකා; හෝ

(*ඇ*) කිලෝවොට් හත්සිය පනහකට වැඩි ප්‍රධාන ප්‍රචාලන බලය සහිත ප්‍රධාන ප්‍රචලන යන්ත්‍රෝපකරණ සවිකර ඇති නෞකා,

වැනි ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති නෞකාවල නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන්ට අදාළ විය යුතු ය.

(2) මේ නියෝග, ධීවර යාත්‍රාවක නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන්ට අදාළ නොවිය යුතු ය.

(3) 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ (මේ නියෝගවල "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් දරන මුහුදු යාත්‍රාකරුවකු මේ නියෝග යටතේ සුදුසුකම් ලබා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

## II වන කොටස

*අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල සහ කාර්ය*

**3.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ නියෝග පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි I වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පන්තිවලට අයත් සහතික, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශ සීමාව සහ ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති ටොන් ප්‍රමාණ සීමාව සඳහා නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පන්තිවලට අයත් සහතික, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශ සීමාව සහ ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති ටොන් ප්‍රමාණ සීමාව සඳහා නිකුත් කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

*ඇතුළත් වීමේ කොන්දේසි සහ අවශ්‍ය සුදුසුකම් නිලධරයන් සහ නිල නොලත් නැවියන්*

**4.** ප්‍රවීණතා සහතිකයක් හෝ නිපුණතා සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු විසින් ම, පහත දැක්වෙන දෑ ඉදිරිපත් කරනු ලැබිය යුතු යථ :-

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) ඔහු දරන තනතුරට අදාළ වූ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා අනුමත කරන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් පරීක්ෂා කරනු ලැබ නිකුත් කරන ලද, ඇස් දෘෂ්ටි ප්‍රමිති පිරික්සුම් සහතිකයක්. එම පරීක්ෂණය, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය;

(*ඇ*) ඔහු දරන තනතුරට අදාළ වූ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා අනුමත කරන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් පරීක්ෂා කරනු ලැබ නිකුත් කරන ලද, වෛද්‍යමය සහ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සහතිකයක්; එම පරීක්ෂණය, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය; සහ

(*ඈ*) නිලධරයන් සම්බන්ධයෙන් වන විට, අයදුම් කිරීමේ දිනට පෙර ලබාගත්, නෞකාවේ නෞකාස්ථව සේවය කිරීම පිළිබඳ සහතික. එම සහතික, එම සේවය ඉටුකරනු ලැබුවේ යම් නෞකාවක නෞකාස්ථව සිටිය දී ද, එම නෞකාවේ නෞකාධිපතිවරයා හෝ ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ එම නෞකාවේ බලයලත් සමාගම් නියෝජිතයකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

## **IV** වන කොටස

*නැව් තට්ටු අංශයෙහි නෞකාධිපතිවරුන්ගේ, නිලධරයන්ගේ සහ නිල නොලත් නැවියන්ගේ පුහුණුව සහ සුදුසුකම් සඳහා වන අනිවාර්ය අවම අවශ්‍යතා*

**5.** (1) දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල සේවය කරන, යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර සෑම නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම අපේක්ෂකයකුම -

(*අ*) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණය ආරම්භ කරන දිනට, වයස අවුරුදු දහසයකට නොඅඩු විය යුතු ය;

(*ආ*) පහත දැක්වෙන දෑ සම්පූර්ණ කර තිබිය යුතු ය;-

(i) අනුමත පුහුණු වැඩසටහනක්ත සහ;

(ii) දළ ටොන් අසූව-පන්සියය දක්වා වන නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; එම කාලසීමාවෙන් යටත් පිරිසෙයින්, මාස හයක් පාලම් මුරකාවල් හා සම්බන්ධ කාර්යය ඉටු කර තිබිය යුතු ය; හෝ

(iii) දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි නෞකාවල නැව් තට්ටු අංශයේ නෞකාස්ථව මාස තිස් හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; එකී මාස තිස් හයක කාලයෙන්, යටත් පිරිසෙයින්, මාස හයක් යාත්‍රාකරණ මුරකාවල යෙදීම හා සම්බන්ධ කාර්ය ඉටු කර තිබිය යුතු ය; හෝ

(*ඇ*) ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශ්‍රාමික නිලධරයන් සම්බන්ධයෙන් වන විට, දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි වෙළඳ නැව්වල අවම වශයෙන් මාස හයක කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි නාවික නෞකාවල යාත්‍රාකරණ අංශයේ මාස විසි හතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ඇ) කුඩා යාත්‍රාවල (දිග මීටර් විසිහතරක් දක්වා වූ) මාස තිස් හයක මුහුදු ගමන් සේවයක් ද සමග යාත්‍රා ප්‍රධානි I වන ශ්‍රේණිය සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඉ) කුඩා යාත්‍රාවල (දිග මීටර් විසිහතරක් දක්වා වූ) මාස හැටක මුහුදු ගමන් සේවයක් ද සමග යාත්‍රා ප්‍රධානි II වන ශ්‍රේණිය සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඒ) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මාස හයකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක් ද, සමග සම්මුතියේ II /1 වන නියෝගයේ නියම කර ඇති සහතිකය ලබා ගැනීමට අවශ්‍ය අනුමත පුහුණු වැඩසටහනක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(උ) වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(2) (1) වන අනුනියෝගයේ (ආ) (ii) වන සහ (ආ) (iii) වන අනුඡේදවලින් නියම කර ඇති මුහුදු ගමන් සේවයට නෞකාධිපතිවරයාගේ හෝ මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයාගේ ඍජු අධීක්ෂණය යටතේ අදාළ කාර්ය කිරීම ද ඇතුළත් විය යුතු ය.

**6.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවක සිටින සෑම නෞකාධිපතිවරයා විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා අයදුම් කරනු ලබන සෑම අපේක්ෂකයකුම -

(අ) දළ ටොන් අසූවකට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ආ) (i) දළ ටොන් පන්සියයකට අඩු නෞකාවක අවම වශයෙන් මාස දොළහක කාලයක මුහුදු ගමන් පළපුරුද්දක් ද සමඟ, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, වෙරළාසන්න ජලතීරයේ මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ii) දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල අවම වශයෙන් මාස දොළහක මුහුදු ගමන් පළපුරුද්දක් ද සමඟ, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයකට හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(iii) දළ ටොන් පන්සියයකට අඩු නෞකාවක ප්‍රධාන උප නැව්පති ලෙස අවම වශයෙන් මාස හයක කාලයක මුහුදු ගමන් පළපුරුද්දක් ද, ප්‍රධාන උප නැව්පති හෝ නෞකාධිපතිවරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිටසන් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවක මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස 2016 ඔක්තෝබර් මස 4 වැනි දිනට පෙර නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශ්‍රාමික නිලධරයන් සම්බන්ධයෙන් වන විට, දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි වෙළඳ නැව්වල මාස හයක කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, අණදෙන පන්තියේ අවම වශයෙන් මාස හයක මුහුදු ගමන් සේවයක් ද ඇතුළුව දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි නාවික නෞකාවල යාත්‍රාකරණ අංශයේ මාස විසිහතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඈ) වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**7.** දේශීය මුහුදු ගමන්වල නියුතු, දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර සෑම නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණය ආරම්භ කරන දිනට වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය;

(*ආ*) (i) අනුමත පුහුණු වැඩසටහනක්; සහ

(ii) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; එම කාල සීමාවෙන්, යටත් පිරිසෙයින්, මාස හයක්වත් පාලම් මුරකාවලෙහි යෙදීම සම්බන්ධ කාර්ය; හෝ

(iii) දළ ටොන් අසූව-පන්සියය දක්වා වන නෞකාවල මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; එම කාල සීමාවෙන්, යටත් පිරිසෙයින්, මාස හයක්වත් යාත්‍රාකරණ මුරකාවලෙහි යෙදීම සම්බන්ධ කාර්ය ඉටු කර තිබිය යුතු ය; හෝ

(ඇ) (i) දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයා ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවා කාලයක පළපුරුද්දක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ii) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) ශ්‍රී ලංකාවේ නාවික හමුදාවේ විශ්‍රාමික නිලධරයන් සම්බන්ධයෙන් වන විට, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි යාත්‍රාවල අවම වශයෙන් මාස හයක මුහුදු සේවයක් ද සමග, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නාවික නෞකාවල යාත්‍රාකරණ අංශයේ මාස විසි හතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(*ඉ*) වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවක සිටින සෑම ප්‍රධාන උප නැව්පතියකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) (i) මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමඟ, මේ නියෝගවල 7 වන නියෝග යෙන් නියම කර ඇති පරිදි දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ii) මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද,

දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(iii) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(iv) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්ද සමග ප්‍රධාන උප නැව්පතියකු හෝ නෞකාධිපතිවරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට අවසර ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දිනට පෙර නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(v) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස මාස තුනකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ එකී නෞකාවල උප ප්‍රධාන නැව්පති ලෙස මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග ප්‍රධාන උප නැව්පති ලෙස හෝ නෞකාධිපතිවරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දිනට පෙර නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(vi) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරන අතරම එකී නෞකාවල මුරකාවල නිලධරයකු ලෙස මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවාකාලයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 6 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස වූ ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

*(ආ)* වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9.** දළ ටොන් තුන්දහසකට අඩු මුහුදු ගමන් නෞකාවක සිටින සෑම නෞකාධිපතිවරයකු විසින් ම ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම්කරන සෑම අපේක්ෂිතයකු ම -

*(අ)* දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ මුරකාවල නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක හෝ ඊට සමානුපාතික කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස වූ ප්‍රවීණතා සහතිකයක් හෝ මේ නියෝගවල 8 වන නියෝගයේ නියම කර ඇති පරිදි, දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල ප්‍රධාන උප නැව්පතිවරයකු ලෙස වූ ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

*(ආ)* දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස මාස හතලිස් අටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අතිවිශේෂ ගැසට්*

*පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 6 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඇ*) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද ප්‍රධාන උප නැව්පති ලෙස හෝ නෞකාධිපතිවරයකු ලෙස හෝ මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් ද සමග, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ එකී නෞකාවල නෞකාධිපතියකු ලෙස මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද, ප්‍රධාන උප නැව්පති ලෙස හෝ නෞකාධිපතිවරයකු ලෙස හෝ මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සීමාකිරීම් සහිතව නිකුත් කරන ලද පිටසනක් ද සමග, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස වූ ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඉ*) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ ප්‍රධාන උප නැව්පති ලෙස වූ ප්‍රවීණතා සහතිකයක් දරන අතරම එකී නෞකාවල මුරකාවල නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස සහතිකයක් දරනු ලැබිය යුතු ය; සහ

(*ඊ*) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**10.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයකට අඩු ටග් යාත්‍රාවල සේවය කරන සෑම ටග් යාත්‍රා උප නැව්පතියකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණය ආරම්භ කරන දිනට වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය; හෝ

(*ආ*) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල මුරකාවල නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල යාත්‍රාකරන මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඇ*) දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල මුරකාවල නිලධරයකු ලෙස මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, මේ නියෝගවල 5 වන නියෝගයේ නියම කර ඇති පරිදි, දළ ටොන් පන්සියයට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ

නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඉ) ටග් යාත්‍රාවල ටග් යාත්‍රා උප නැව්පති ලෙස හෝ නාවික හමුදා නෞකාවල සුළු නිලධරයකු හෝ ඊට ඉහළ නිලධරයකු ලෙස අවම වශයෙන් වසර පහක් හෝ ඊට වැඩි කාලයක මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, එය අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි අදාළ අධිකාරිය විසින් අනුමත කළ හැකි විය යුතු ය; සහ

(ඊ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

11. දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයට අඩු ටග් යාත්‍රාවල සේවය කරන සෑම ටග් යාත්‍රා නෞකාධිපතිවරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල මුරකාවල නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, මේ නියෝගවල 5 වන නියෝගයේ නියම කර ඇති පරිදි, දළ ටොන් පන්සියයට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ආ) දළ ටොන් පන්සියයට අඩු ටග් යාත්‍රාවල මඟී යාත්‍රා උප නැව්පති ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, මේ නියෝගවල 10 වන නියෝගයේ නියම කර ඇති පරිදි, දළ ටොන් පන්සියයට අඩු ටග් යාත්‍රාවල ටග් යාත්‍රා උපනැව්පති ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල මුරකාවල නිලධරයකු ලෙස මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ එකී නෞකාවල හෝ ටග් යාත්‍රාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත‍්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග නිකුත් කරන ලද. දළ ටොන් පන්සියයට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඈ) යටත් පිරිසෙයින් මාස හයක් දළ ටොන් 500 ට අඩු ටග් යාත්‍රාවල ටග් යාත්‍රා උප නැව්පතියකු ලෙස සේවය කිරීම ඇතුළුව මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඉ) යටත් පිරිසෙයින් මාස හයක් දළ ටොන් පන්සියයකට අඩු ටග් යාත්‍රාවල ටග් යාත්‍රා සේවයේ යෙදීම ඇතුළුව මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 6 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ, දළ ටොන් පන්සියයකට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; සහ

(ඊ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

12. දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් තුන්දහසකට අඩු මුහුදු ගමන්වල යෙදෙන ටග් යාත්‍රාවල යාත්‍රකරණ මුරකාවලක කාර්යභාර සෑම නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණය ආරම්භ කරන දිනට වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය;

(*ආ*) පහත දැක්වෙන දෑ සම්පූර්ණ කර තිබිය යුතු ය:-

(i) අනුමත පුහුණු වැඩසටහනක්; සහ

(ii) දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; එම කාලසීමාවෙන්, යටත් පිරිසෙයින්, මාස හයක් යාත්‍රාකරණ මුරකාවලෙහි යෙදීම හා සම්බන්ධ කාර්ය ඉටු කර තිබිය යුතු ය; හෝ

(iii) දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; එම කාලසීමාවෙන්, යටත් පිරිසෙයින්, මාස හයක් යාත්‍රාකරණ මුරකාවලෙහි යෙදීම හා සම්බන්ධ කාර්ය ඉටු කර තිබිය යුතු ය; හෝ

(*ඇ*) 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල මුරකාවල නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝම්බර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඉ*) දළ ටොන් පන්සියයට අඩු ටග් යාත්‍රාවල ටග් යාත්‍රා උප නැව්පති ලෙස හෝ ටග් යාත්‍රා නෞකාධිපතිවරයකු ලෙස හෝ දළ ටොන් 500 ට අඩු නෞකාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස හෝ නෞකාධිපතිවරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඊ*) ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශ්‍රාමික නිලධරයන් සම්බන්ධයෙන් වන විට, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නාවික නෞකාවල යාත්‍රාකරණ අංශයේ මාස විසිහතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(*උ*) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

13. දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් තුන්දහසට අඩු මුහුදු ගමන්වල යෙදෙන ටග් යාත්‍රාවල සෑම ටග් යාත්‍රා උප නැව්පතියකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) දළ ටොන් තුන්දහසකට අඩු ටග් යාත්‍රාවල මුරකාවල නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවා කාලයක් තිබිය යුතු ය; සහ

(ආ) යටත් පිරිසෙයින්, මාස දොළහක් දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි ටග් යාත්‍රාවල සේවය කිරීම ඇතුළුව මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 5 වන සහ 10 වන නියෝගවල නියම කර ඇති පරිදි වූ, දළ ටොන් පන්සියයට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඈ) දළ ටොන් පන්සියයට අඩු ටග් යාත්‍රාවල මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 6 වන නියෝගයේ සහ 11 වන නියෝගයන්හි නියම කර ඇති පරිදි වූ, දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඉ) යටත් පිරිසෙයින්, මාස හයක ටග් යාත්‍රාවල සිදුකරන ලද මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් 500 ක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඊ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**14.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් තුන්දහසකට අඩු මුහුදු ගමන්වල යෙදෙන ටග් යාත්‍රාවල සෑම ටග් යාත්‍රා නෞකාධිපතිවරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි ටග් යාත්‍රාවල ටග් යාත්‍රා උප නැව්පතියකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ එකී ටග් යාත්‍රාවල යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ද සමග, මේ නියෝගවල 13 වන නියෝගයේ නියම කර ඇති පරිදි , දළ ටොන් තුන්දහසකට අඩු ටග් යාත්‍රාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ආ) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි ටග් යාත්‍රාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක හෝ ටග් යාත්‍රාවල නෞකාධිපතිවරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, ප්‍රධාන උප නැව්පතියකු ලෙස හෝ නෞකාධිපතිවරයකු ලෙස හෝ මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් ද සමග, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඇ*) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි වග් යාත්‍රාවල වග් යාත්‍රා උප නැව්පතියකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක් හෝ එකී වග් යාත්‍රාවල යාත්‍රකරණ මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 8 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ, දළ ටොන් තුන්දහසකට අඩු නෞකාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) දළ ටොන් තුන්දහසකට අඩු වග් යාත්‍රාවල නෞකාධිපතිවරයකු ලෙස මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් තුන්දහසට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඉ*) දළ ටොන් පන්සියයට අඩු වග් යාත්‍රාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස හෝ නෞකාධිපතිවරයකු ලෙස මාස හතලිස් අටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද නෞකාධිපතිවරයකු හෝ උප නැව්පති ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් 1978 මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ පුහුණු කිරීමේ, සහතික කිරීමේ හා ප්‍රමිති පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ I/10 නියෝගයට අනුව පිළිගත් වෙනත් රටවල් විසින් නිකුත් කරන ලද පිටසනක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඊ*) දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි වග් යාත්‍රාවල උප වග් යාත්‍රා නැව්පති ලෙස මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, දළ ටොන් පන්සියයක් හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පතියකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*උ*) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**15.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ, සෑම නිල නොලත් නැවියකු විසින් ම වලංගු නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය; සහ

(*ආ*) පහත දැක්වෙන දෑ සම්පූර්ණ කර තිබිය යුතු ය:-

(i) අනුමත පුහුණු වැඩසටහනක්; සහ

(ii) මුහුදු ගමන් සේවය පිළිබඳව සහතික සහ නෞකා පැදවීමේ සහතික ඇතුළුව දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි නෞකාවල මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවා කාලයක්; හෝ

(iii) දළ ටොන් අසූවක් හෝ ඊට වැඩි නැව් තට්ටු අංශයෙහි නෞකාස්ථව සිදු කරනු ලබන මාස නවයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවා කාලයක්.

**16.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන සෑම සමත් මුහුදු යාත්‍රාකරුවකු-නැව් තට්ටු විසින් ම, වලංගු නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු ම -

(*අ*) මේ නියෝගවල 15 වන නියෝගයේ නියම කර ඇති පරිදි යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියකු ලෙස වූ සහතිකයක් නිකුත් කිරීම සඳහා වන නියමයන් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය; සහ

(*ආ*) නැව් තට්ටු අංශයේ -

(i) මාස දොළහකට නොඅඩු කාලයක් අනුමත මුහුදු ගමන් සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ii) මාස නවයකට නොඅඩු කාලයක් අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, අනුමත පුහුණු වාර්තා පොතක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

## V වන කොටස

### *ගුවන් විදුලි සන්නිවේදන සහ ගුවන් විදුලි ක්‍රියාකරුවන්*

**17.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, (ප්‍රවීණතා සහතික දරන්නා වූ) සියලුම නැව් තට්ටු නිලධරයන් විසින් විශ්ව සමුද්‍රීය ආපදා සහ ආරක්ෂක ක්‍රම පද්ධති (GMDSS) සීමිත ගුවන් විදුලි ක්‍රියාකරුවකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(*අ*) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ කරන දිනට වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය;

(*ආ*) වෘත්තීය අචාරධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(*ඇ*) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් අධිකාරියක් විසින් නිකුත් කරන ලද GMDSS සීමිත ගුවන් විදුලි ක්‍රියාකරු සහතිකයක් දරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### *ඇංජින් අංශයේ සමුද්‍රීය ඉංජිනේරු නිලධරයන්ගේ සහ නිල නොලත් නැවියන්ගේ පුහුණුව සහ සුදුසුකම් සඳහා වූ අනිවාර්ය අවම නියමයන්*

**18.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට අඩු ප්‍රචාලන බලයක් සහිත ප්‍රධාන ප්‍රචාලන යන්ත්‍ර මගින් බලගැන්වූ නෞකාවල, මිනිසුන් යෙදූ ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවලක කාර්යභාර නිලධරයකු විසින් ම හෝ වරින් වර මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක සිටින සෑම නිලලත් කාර්ය ඉංජිනේරුවකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණය ආරම්භ කරන දිනට වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය; සහ

(*ආ*) පහත දැක්වෙන දෑ සම්පූර්ණ කර තිබිය යුතු ය:-

(i) සහතිකලත් ඇංජින් නිලධරයකුගේ අධීක්ෂණය යටතේ මාස තුනක කාලයක ඇංජින් කාමර මුරකාවලෙහි යෙදීම ඇතුළුව අනුමත ඒකාබද්ධ වැඩමුළු නිපුණතා පුහුණුවක් සහ ප්‍රචාලන බලය කිලෝ වොට් දෙසිය

පනහක් හෝ ඊට වැඩි නෞකාවල ඇංජින් අංශයේ මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; හෝ

(ii) අශ්වබල සහතිකයක් ද සමග, කිලෝ වොට් දෙසිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඇංජින් අංශයෙහි මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; හෝ

(iii) කිලෝ වොට් දෙසිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත ප්‍රධාන ප්‍රචාලන යන්ත්‍ර මගින් බල ගැන්වූ නෞකාවල ඇංජින් කාමර කාර්යයන්හි මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; හෝ

(iv) යටත් පිරිසෙයින්, සමුද්‍රීය හෝ යාන්ත්‍රික (මෝටර් රථ) අංශවල NVQ 3 වන මට්ටමේ සහතිකයක් ද සමග, කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත ප්‍රධාන ප්‍රචාලන යන්ත්‍ර මගින් බලගැන්වූ නෞකාවල ඇංජින් කාමර කාර්යයන්හි මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; හෝ

(v) යටත් පිරිසෙයින් මාස දොළහකට නොඅඩු කාලයක වෙරළාශ්‍රිත පළපුරුද්දක් සහ-

(අ) සමුද්‍රීය හෝ යාන්ත්‍රික (මෝටර් රථ) අංශවල NVQ 2 වන මට්ටමේ සහතිකයක්; හෝ

(ආ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පිළිගත් වසරක පූර්ණ කාලීන පුහුණු වැඩසටහන්,

සමග කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත ප්‍රධාන ප්‍රචාලන යන්ත්‍ර මගින් බලගැන්වූ නෞකාවල ඇංජින් කාර්යයන්හි මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; සහ

(ඇ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

**19.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට අඩු ප්‍රචාලන බලයක් සහිත ප්‍රධාන ප්‍රචාලන යන්ත්‍ර මගින් බලගැන්වූ නෞකාවල සෑම ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(අ) කිලෝ වොට් දෙසිය පනහක හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග වෙරළාසන්න ජලතීරයේ හෝ අසීමිත පරිදි මුහුදු ගමන්වල යෙදෙන හෝ මේ නියෝගවල 18 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබි යුතු ය;

(ආ) කිලෝ වොට් දෙසිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, ප්‍රධාන ඉංජිනේරුවරයකු ලෙස හෝ දෙවන ඉංජිනේරුවරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශ්‍රාමික නිලධරයන් සම්බන්ධයෙන් වන විට, යටත් පිරිසෙයින් මාස හයක කාලයක් වෙළඳ නෞකාවල සේවය කිරීම ද සමග, කිලෝ වොට් දෙසිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නාවික නෞකාවල ඇංජින් අංශයේ මාස විසිහතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඇ) වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ, සහ ඇගයීම සම්පූර්ණ කර තිබිය යුතුය; සහ,

**20.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් තුන්දහසකට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර සෑම නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) ඒකාබද්ධ වැඩමුළු නිපුණතා පුහුණුවක් සහ කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඇංජින් අංශයේ මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ආ) දේශීය මුහුදු ගමන්වල යෙදෙන කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස වලංගු ප්‍රවීණතා සහතිකයක් ද සමඟ, කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ඇ) දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස වූ වලංගු ප්‍රවීණතා සහතිකයක් සමග, කිලෝ වොට් දෙසිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ඈ) මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ හා මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති (STCW) ව්‍යවස්ථා සංග්‍රහයේ III/1 වගන්තියට අනුකූලව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද අනුමත පෙර මුහුදු පාඨමාලාවක් ද සමග, කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ඉ) කිලෝ වොට් හත්සිය පනහකට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස වූ වලංගු ප්‍රවීණතා සහතිකයක් හෝ බෝට්ටු ඉංජිනේරු - I ශ්‍රේණියේ බලපත්‍රයක් ද සමග, කිලෝ වොට් දෙසිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ඊ) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත වෙළඳ නෞකාවල මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, ශ්‍රී ලංකා නාවික හමුදා යාත්‍රාවල ඉංජිනේරු අංශයේ සුලු නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(උ) සුදුසුකම්ලත් ඉංජිනේරු නිලධරයකුගේ අධීක්ෂණය යටතේ කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඇංජින් කාමර කාර්යයන්හි මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඌ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**21.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන කිලෝ වොට් තුන්දහසකට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල සෑම සමුද්‍රීය දෙවැනි ඉංජිනේරු නිලධරයකු විසින්ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) කිලෝ වොට් හතත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සහිත,

වෙරළාසන්න ජල තීරයේ මුහුදු ගමන්වල යෙදෙන හෝ මේ නියෝගවල 20 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ආ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල අසීමිත පරිදි වූ, ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඇ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත යාත්‍රාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ එකී යාත්‍රාවල දෙවන ඉංජිනේරුවරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, දෙවන ඉංජිනේරුවරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් හත්සිය පනහකට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ප්‍රධාන ඇංජින් නිලධරයකු ලෙස මාස විසිහතරකට නොඅඩු කාලයක අනුමත දේශීය මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(*ඉ*) මේ නියෝගවල 18 වන නියෝගයේ නියම කර ඇති පරිදි I වන ශ්‍රේණියේ බලපත්‍රයක් සහිත බෝට්ටු ඉංජිනේරුවරයකු ලෙස නෞකාවල මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(*ඊ*) වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තැබිය යුතු ය.

**22.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් තුන්දහසකට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල සෑම ඉංජිනේරු නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) මේ නියෝගවල 18 වන නියෝගයේ නියම කර ඇති පරිදි, මාස දොළහකට නොඅඩු කාලයක හෝ මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, මේ නියෝගවල 21 වන නියෝගයේ නියම කර ඇති පරිදි ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ආ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඇ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ප්‍රධාන ඇංජින් නිලධාරි ලෙස මාස හයක කාලයක් හෝ දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල දෙවන ඇංජින් නිලධාරී ලෙස මාස හයක කාලයක් හෝ ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් හෝ 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ

සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර සිටින නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; සහ

(ඉ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**23.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, ටග් යාත්‍රාවල වෙරළාසන්න ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමඟ, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද හෝ මේ නියෝගවල 18 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ, කිලෝ වොට් තුන්දහසකට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; සහ

(*ආ*) සුදුසුකම්ලත් ඉංජිනේරු නිලධරයකුගේ අධීක්ෂණය යටතේ කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඇංජින් අංශයේ මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(*ඇ*) වෘත්තීය අචාරධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**24.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් හයදහසකට අඩු ප්‍රචාලන බලයක් සහිත ටග් යාත්‍රාවල සෑම සමුද්‍රීය දෙවන ඉංජිනේරු නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(*අ*) ටග් යාත්‍රාවල වෙරළාසන්න ඉංජිනේරු මුරකාවල භාරව සිටින නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමඟ, මේ නියෝගවල 21 වන නියෝගයේ නියම කර ඇති පරිදි ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ආ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමඟ, 2016 ඔක්තෝබර් මස 4 වැනි දින 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග යටතේ නිකුත් කරන ලද, කිලෝ වොට් හත්සිය පනහට වැඩි නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; සහ

(*ඇ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමඟ, දෙවන ඇංජින් නිලධරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(*ඈ*) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක හෝ ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස හයකට නොඅඩු

කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඉ) මාස දහඅටකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ද සමග මේ නියෝගවල 20 වන නියෝගයේ නියම කර ඇති පරිදි වූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; සහ

(ඊ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**25.** ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු ගමන්වල යෙදෙන, කිලෝ වොට් හයදහසට අඩු ප්‍රචාලන බලයක් සහිත ටග් යාත්‍රාවල සෑම සමුද්‍රීය ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු විසින් ම වලංගු ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, මේ නියෝගවල 24 වැනි නියෝගයේ නියම කර ඇති පරිදි ප්‍රවීණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය; හෝ

(ආ) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්යභාර නිලධරයකු ලෙස මාස දහඅටකට නොඅඩු කාලයක හෝ දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු කාලයක හෝ ඊට සමානුපාතික කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, දෙවන ඉංජිනේරු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල දෙවන ඉංජිනේරු නිලධරයකු ලෙස මාස දහඅටකට නොඅඩු කාලයක හෝ ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස හෝ මාස දොළහකට නොඅඩු කාලයක හෝ ඊට සමානුපාතික කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ද සමග, ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු ලෙස මුහුදු ගමන්වල යෙදීමට ඉඩ ලබා දෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පිටසනක් දරනු ලැබිය යුතු ය; හෝ

(ඉ) කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත ටග් යාත්‍රාවල ඇංජින් කාමර ශිල්පියෙකු ලෙස මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඊ) වෘත්තීය අචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**26.** දේශීය මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල ඉංජිනේරු මුරකාවලෙහි කොටසක් වූ සෑම නිල නොලත් නැවියකු විසින් ම වලංගු නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු ය;

(ආ) පහත දැක්වෙන දෑ සම්පූර්ණ කර තිබිය යුතු ය:-

(i) අනුමත පුහුණු වැඩසටහනක්; සහ

(ii) කිලෝ වොට් 750 ක ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඇංජින් අංශයේ මාස හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; ඊට මුහුදු සේවය පිළිබඳ සහතික ද ඇතුළත් විය යුතු ය;

හෝ

(ඇ) කිලෝ වොට් දෙසිය පනහ - හත්සිය පනහ දක්වා වූ ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස දහඅටකට නොඅඩු කාලයක හෝ කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස නමයකට නොඅඩු කාලයක හෝ ඊට සමානුපාතික මුහුදු ගමන් සේවයක්; සහ

(ඈ) යටත් පිරිසෙයින්, කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවල ඇංජින් අංශයේ මාස විසිහතරක කාලයක මුහුදු ගමන් සේවයක් ද සමග, කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස හයකට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක්.

27. දේශීය මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල සෑම සමත් මුහුදු යාත්‍රාකරුවකු - ඇංජින් කාමර විසින් ම වලංගු නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) නියෝගවල 26 වන නියෝගයේ නියම කර ඇති පරිදි ඉංජිනේරු මුරකාවලෙහි කොටසක් වූ නිල නොලත් නැවියකු ලෙස සහතිකයක් ලබා ගැනීම සඳහා වන නියමයන් සපුරා තිබිය යුතු ය; සහ

(ආ) (i) කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල එන්ජින් අංශයේ මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; හෝ

(ii) කිලෝ වොට් හත්සිය පනහට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඇංජින් අංශයේ මාස නවයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, අනුමත පුහුණු වාර්තා පොතක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

28. දේශීය මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල සෑම විද්‍යුත් නිල නොලත් නැවියකු විසින් ම වලංගු නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු අතර, සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) වයස අවුරුදු දහසයට නොඅඩු විය යුතු යත

(ආ) පහත දැක්වෙන දෑ සම්පූර්ණ කර තිබිය යුතු යථ-

(i) අනුමත පුහුණු වැඩසටහනක්; සහ

(ii) කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල එන්ජින් අංශයේ මාස දොළහකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක්; ඊට මුහුදු සේවය පිළිබඳ සහතික ද ඇතුළත් වියයුතු ය; හෝ

(ඇ) යටත් පිරිසෙයින්, NVQ 3 වන මට්ටමේ සහතිකයක් හෝ අනුමත පෙර මුහුදු පුහුණු වැඩසටහනක් ද සමග, යටත් පිරිසෙයින්, පුහුණු වන විදුලි රැහැන් නඩත්තු කරන්නකු ලෙස කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස නවයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඈ) යටත් පිරිසෙයින්, පුහුණුවන විදුලි කාර්මිකයකු හෝ පුහුණු වන විදුලි රැහැන් නඩත්තු කරන්නකු ලෙස කිලෝ වොට් හත්සිය පනහකට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මාස තිස්හයකට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

## VII වන කොටස

### *විශේෂ නියමයන්*

**29.** 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවල දක්වා ඇති පරිදි පහත දැක්වෙන ප්‍රභේදවලට අයත් තැනැත්තන්ගේ පුහුණුව සහ සුදුසුකම් සඳහා වන අනිවාර්ය අවම නියමයන්:

(*අ*) තෙල්, රසායනික ද්‍රව්‍ය සහ ගෑස් පටවන නෞකාවල නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ නිල නොලත් නැවියන්;

(*ආ*) මගී නෞකාවල නෞකාධිපතිවරයන්, නිලධරයන්, නිල නොලත් නැවියන් සහ අනෙකුත් සේවක පිරිස; සහ

(*ඇ*) සියලුම මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන ආරක්ෂාව පිළිබඳ හුරු කිරීම, මූලික පුහුණුව සහ උපදෙස්,

සඳහා අදාළ විය යුතු ය.

**30.** (1) යාත්‍රාකරණයෙහි හෝ සමුද්‍රීය ඉංජිනේරුමය කාර්යයන්හි ආධාරක මට්ටමේ සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු විසින් ම අදාළ පුහුණුව සම්පූර්ණ කරනු ලැබිය යුතු අතර, නැව් තට්ටු හෝ ඇංජින් කාමර කාර්යයන්හි කොටසක් වූ නිල නොලත් නැවියන් සම්බන්ධයෙන් වන වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ නියම කර ඇති කර්තව්‍ය සඳහා වන ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතු ය.

(2) යාත්‍රාකරණයෙහි හෝ සමුද්‍රීය ඉංජිනේරුමය කාර්යයන්හි සමත් මුහුදු යාත්‍රාකරුවකු ලෙස ආධාරක මට්ටමේ සහතික සඳහා ඉලලුම් කරන සෑම අපේක්ෂකයකු විසින්ම, නැව් තට්ටු හෝ එන්ජින් කාමර කාර්යයන්හි කොටසක් වූ නිල නොලත් නැවියන් සම්බන්ධයෙන් වන වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා තිබීම අමතරව, අදාළ පුහුණුව සම්පූර්ණ කොට, සමත් නැව් තට්ටු හෝ ඇංජින් කාමර මුහුදු යාත්‍රාකරුවන් සම්බන්ධයෙන් වන වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයේ නියම කර ඇති සියලු කර්තව්‍ය සඳහා වන ප්‍රවීණතා මට්ටම ද සපුරා තිබිය යුතු ය.

## VIII වන කොටස

### *මුහුදු ගමන් සේවය ගණනය කිරීම*

**31.** (1) යම් ප්‍රවීණතා සහතිකයක් සඳහා නිලධරයන් සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් ලැබීම සඳහා වූ මුහුදු ගමන් සේවය, ප්‍රවීණතාව ඇගයීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ වසර දහයක කාලසීමාව ඇතුළත ඉටු කරනු ලැබිය යුතු අතර, ප්‍රවීණතාව ඇගයීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ වසර පහ ඇතුළත මාස දොළහක කාලයක මුහුදු ගමන් සේවයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

(2) සම්ප්‍රදායානුකූල මුර සේවා ක්‍රමචර්යා නොවන කටයුතුවල යෙදෙන නෞකාවල වැඩ පරිචයන්හි නියුක්ති කරනු ලැබූ ඉංජිනේරු නිලධරයන් විසින් ඉටු කරනු ලබන මුහුදු ගමන් සේවය මගින් නියමිත පළපුරුද්දට සමාන පළපුරුද්දක් ලැබෙන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, එවැනි මුහුදු ගමන් සේවයක් සුදුසුකම් ලැබීම් මුහුදු ගමන් සේවය ලෙස පිළිගනු ලැබිය හැකි ය.

(3) සම්මුතියේ නියමයන්ට අනුකූල වෙමින් කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල, මිනිසුන් යෙදූ ඇංජින් කාමර භාරව සිටින නිලධරයකු ලෙස හෝ කලින් කල මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක නිලලත් කාර්යභාර ඉංජිනේරුවරයකු ලෙස ප්‍රවීණතා සහතික ලබා ගැනීමට අදහස් කරන ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍රීය ඉංජිනේරු අංශයේ නිලධරයන් විසින් අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය. එකී අපේක්ෂකයා සතුව

දැනටමත් යම් පළපුරුද්දක්, සුදුසුකම් සහ සහතික තිබේ නම්, ඒවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසුකම් ලැබීම සඳහා වෙළඳ නැව් මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම් නිශ්චය කිරීමේ පදනම විය යුතු ය. ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවල නෞකාස්ථව ඉටු කරනු ලබන වෙළඳ නැව් මුහුදු ගමන් සේවය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචලිත බලයක් සහිත නෞකාවල මිනිසුන් යෙදූ ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවල කාර්යභාර නිලධරයකු සඳහා හෝ කලින් කල මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක නිලලත් කාර්යභාර ඉංජිනේරුවරයකු සඳහා වන පරීක්ෂා සඳහා අනුමත මුහුදු ගමන් සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සම්මුතියේ නියමයන්ට අනුකූල වෙමින් වෙරළාසන්න මුහුදු ගමන් සඳහා වූ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමට අදහස් කරනු ලබන, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍ර ඉංජිනේරු අංශයේ සුළු නිලධරයන් සහ ඇංජින් කාමර ශිල්පීන් විසින් අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය. එකී අපේක්ෂකයා සතුව දැනට යම් පළපුරුද්දක්, සුදුසුකම් සහ සහතික තිබේ නම් ඒවා, ප්‍රධාන ඉංජිනේරු පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසුකම් ලත් වෙළඳ නැව් මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම් නිශ්චය කිරීමේ පදනම විය යුතු ය. ප්‍රධාන ඉංජිනේරු පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවල නෞකාස්ථව ඉටු කරනු ලබන මුහුදු ගමන් සේවය, කිලෝ වොට් හත්සිය පනහක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයක් සහිත නෞකාවල මිනිස් සේවකයන් සහිත කාමරයක ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයකු සඳහා හෝ කලින් කල මිනිස් සේවකයන් රහිතව ක්‍රියාකරන ඇංජින් කාමරයක නිලලත් කාර්යභාර ඉංජිනේරුවරයකු සඳහා වන පරීක්ෂණ සඳහා අනුමත මුහුදු ගමන් සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයට අඩු නෞකාවල හෝ ටග් යාත්‍රාවල යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීමට අදහස් කරනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක නිලධාරී අංශයේ නිලධරයන් විසින් අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය. එවැනි අපේක්ෂකයකු සතුව දැනට යම් පළපුරුද්දක්, සුදුසුකම් සහ සහතික තිබේ නම්, ඒවා, අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසුකම් ලැබීමේ වෙළඳ නැව් මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම් නිශ්චය කිරීමේ පදනම විය යුතු ය. අදාළ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියයකට අඩු ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවල නෞකාස්ථව ඉටු කරනු ලබන ප්‍රචාලන කාලය අනුමත මුහුදු ගමන් සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) සම්මුතියේ නියමයන්ට අනුකූලවෙමින්, ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් තුන්දහසට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයන් ලෙස ප්‍රවීණතා සහතික ලබා ගැනීමට අදහස් කරන ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක නිලධාරී අංශයේ නිලධරයන් විසින් අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය. එවැනි අපේක්ෂකයකු සතුව දැනට යම් පළපුරුද්දක්, සුදුසුකම් සහ සහතික තිබේ නම්, ඒවා, ඒ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසුකම් ලැබීමේ වෙළඳ නැව් මුහුදු ගමන් සේවය පුහුණුව සහ ඇගයීම් නිශ්චය කිරීමේ පදනම විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු ගමන්වල යෙදෙන, දළ ටොන් පන්සියය සහ දළ ටොන් තුන්දහස අතර ශ්‍රී ලංකා නාවික හමුදාවෙහි නෞකාවල නෞකාස්ථව ඉටු කරනු ලබන ප්‍රචාලන කාලය අනුමත මුහුදු ගමන් සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**32.** මේ නියෝගවල -

"සමත් මුහුදු යාත්‍රාකරු - නැව් තට්ටු" යන්නෙන්, සම්මුතියේ II/5 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව සුදුසුකම්ලත් නිල නොලත් නැවියකු අදහස් වේ;

"සමත් මුහුදු යාත්‍රාකරු ඇංජින් කාමර" යන්නෙන්, සම්මුතියේ III/5 නියෝගයේ විධිවිධානවලට අනුකූලව සුදුසුකම්ලත් නිල නොලත් නැවියකු අදහස් වේ;

"පරිපාලනය" යන්නෙන්, මේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"අනුමත කරන ලද" යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ප්‍රධාන පරීක්ෂකවරයකු හෝ විසින් අනුමත කරන ලද බව අදහස් වේ;

"අනුමත අධ්‍යාපන, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම්" යන්නෙන්, සම්මුතිය යටතේ සහතික සහ පිටසන් නිකුත් කිරීමේ කාර්යය සඳහා පරීක්ෂණ සහ ඇගයීම් ඇතුළුව, පුහුණු කිරීම් සහ ප්‍රමිති අවශ්‍යතා නියම කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ, මුහුදු යාත්‍රාකරුවන්ගේ පුහුණුව සහ අධ්‍යාපනය පිළිබඳ වැඩසටහනක් අදහස් වේ;

"ප්‍රවීණතා සහතිකය" යන්නෙන්, සම්මුතියේ II වන, III වන, IV වන හෝ VII වන පරිච්ඡේදවල විධිවිධානවලට අනුකූලව නෞකාධිපතිවරයන්, නිලධරයන් සහ GMDSS ගුවන්විදුලි ක්‍රියාකරුවන්ට නිකුත් කරනු ලබන්නා වූ සහ පිටසන් කරනු ලබන්නා වූ ද, එය නීත්‍යානුකූලව දරන තැනැත්තාට එම තත්ත්වයෙන් සේවය කිරීමට සහ එහි නිශ්චිතව දක්වා ඇති වගකීම් තලවලට අදාළ කර්තව්‍ය ඉටු කිරීමට හිමිකම් ලබා දෙන්නා වූ ද, සහතිකයක් අදහස් වේ;

"නිපුණතා සහතිකය" යන්නෙන්, මුහුදු යාත්‍රාකරුවන්ගේ පුහුණුව, ප්‍රවීණතාව හෝ මුහුදු ගමන් සේවය පිළිබඳව සම්මුතියේ ඇතුළත් අදාළ නියමයන් සපුරා ඇති බවට සඳහන් කරමින් එකී මුහුදු යාත්‍රාකරුවන්ට නිකුත් කරනු ලබන්නා වූ, ප්‍රවීණතා සහතිකයක් නොවන, සහතිකයක් අදහස් වේ;

"ප්‍රධාන ඉංජිනේරු නිලධරයා" යන්නෙන්, නෞකාවේ යාන්ත්‍රික ප්‍රචාලනය සහ එහි යාන්ත්‍රික සහ විදුලි සවිකිරීම් ක්‍රියාකරවීම සහ නඩත්තු කිරීම පිළිබඳ වගකිවයුතු ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධරයා අදහස් වේ;

"උප ප්‍රධාන නැව්පති" යන්නෙන්, නිලයෙන් නෞකාධිපතිවරයාට සමීපතම පහළ නිලය දරන්නා වූ ද, නෞකාධිපතිවරයාගේ අශක්නුතාවක දී නෞකාවේ අණදීම, පාලනය හෝ භාරය පැවරෙන්නා වූ ද, නැව් තට්ටු නිලධරයා අදහස් වේ;

"වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහය" යන්නෙන්, මුහුදු යාත්‍රාකරුවන්ගේ සමුද්‍රීය අධ්‍යාපන වැඩසටහන් ඇගයීම සහ සහතික නිකුත් කිරීමේ නියමයන් ඇතුළත් වූ ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද්දා වූ ද, අවශ්‍ය පරිදි සංශෝධනය කළ හැකි වූ ද, අනුමත මඟපෙන්වීමේ ලේඛනයක් හෝ අත්පොතක් අදහස් වේ;

"සමාගම" යන්නෙන්, නෞකාවේ හිමිකරු හෝ, හිමිකරුගෙන් නෞකාව මෙහෙයවීමේ වගකීම භාරගනු ලැබූවා වූ ද, එසේ වගකීම භාර ගැනීමෙන් පසුව මේ නියෝග මගින් සමාගම වෙත නියම කරනු ලැබ ඇති සියලු කාර්ය සහ වගකීම් භාර ගැනීමට එකඟ වී ඇත්තා වූ ද, කළමණාකරු හෝ ආවරණ රහිත බෝට්ටු කුලියට දෙන තැනැත්තකු වැනි වෙනත් ඕනෑම සංවිධානයක් හෝ පුද්ගලයෙකි;

"සම්මුතිය" යන්නෙන්, 1984 අප්‍රේල් මස 28 වැනි දින බලාත්මකභාවයට පත් වූ ද, 1978 ජූලි මස 7 වැනි දින, මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීම සහ සහතික නිකුත් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ දී සම්මත කර ගනු ලැබුවා වූ ද, 1978 මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ පුහුණු කිරීමේ සහතික කිරීමේ හා මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (STCW) 1978, අදහස් වන අතර ඊට පසුකාලීනව එයට කරනු ලබන සියලු සංශෝධන ද ඇතුළත් වේ;

"දේශීය මුහුදු ගමන" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් වරායක සිට එකී වරාය වෙතම හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් වරායක් වෙත සිදු කරනු ලබන මුහුදු ගමනක් අදහස් වේ;

"ඉංජිනේරු නිලධරයා" යන්නෙන්, සම්මුතියේ III/1, III/2 හෝ III/3 නියෝගවල විධිවිධානවලට අනුකූලව සුදුසුකම්ලත් නිලධරයකු අදහස් වේ;

"ප්‍රධාන පරීක්ෂකවරයා" යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන, නෞකාධිපතිවරුන්ගේ සහ නැව් තට්ටු අංශයේ සේවක පිරිසගේ හෝ ඇංජින් අංශයේ සේවක පිරිසගේ පරීක්ෂකවරයකු අදහස් වේ;

"කර්තව්‍ය" යන්නෙන්, නෞකාවක් මෙහෙයවීම, මුහුදේ දී ජීවිත ආරක්ෂාව සහ සාගර පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන බවට මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ හා මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති (STCW) ව්‍යවස්ථා සංග්‍රහයෙහි නිශ්චිතව දක්වා ඇති වැඩ, කාර්ය සහ වගකීම් සමූහය අදහස් වේ;

"GMDSS" යන්නෙන්, විශ්ව සමුද්‍රීය ආපදා සහ ආරක්ෂක ක්‍රම පද්ධතිය අදහස් වේ;

"නෞකාධිපති" යන්නෙන්, නෞකාවක අණදීම භාරව සිටින තැනැත්තා අදහස් වේ;

"මාසය" යන්නෙන්, ලිත් මාසයක් හෝ එක් මාසයකට අඩු කාල පරිච්ඡේදවලින් සැදුනු දින තිහක් අදහස් වේ;

"වෙරළාසන්න මුහුදු ගමන්" යන්නෙන්, පරිපාලනය විසින් තීරණය කරනු ලබන පරිදි මුහුදු ගමන්වල දී ආරක්ෂිත නැව් තොටවල සමීපත්වය සම්බන්ධයෙන් විශේෂිතව සඳහන් කොට දැක්වීමට යටත්ව, බංග්ලාදේශය, ඉන්දියාව, මාලදිවයින, මියන්මාර් සහ ශ්‍රී ලංකාව යන රටවල යම් වරායක් හෝ ස්ථානයක සිට එකී රටවල වෙනත් යම් වරායකට හෝ ස්ථානයකට මුහුදුබඩ වෙළඳාමේ යෙදී සිටින නෞකාවක මුහුදු ගමන් අදහස් වේ;

"NVQ මට්ටම" යන්නෙන්, පිළිගත් වෘත්තීය ප්‍රමිති වැඩ මූලික හෝ අනුකාරක වැඩ මූලික ඇගයීම් මත පදනම් වූ ද, වෘත්තීය ප්‍රවීණතාවක් ලබා දෙන්නා වූ ද, RQF සුදුසුකම් අදහස් වේ;

"නිලධරයා'' යන්නෙන්, එවැන්නකු ලෙස ජාතික නීතිය හෝ නියෝග අනුව නම් කර ඇත්තා වූ ද, එසේ නම් කර නොමැති අවස්ථාවක, සාමූහික එකඟත්වය හෝ සිරිත් අනුව නම් කරනු ලැබ ඇත්තා වූ ද, නෞකාධිපති හෝ නිල නොලත් නැවියකු හෝ සමත් මුහුදු යාත්‍රාකරුවකු නොවන, නාවික පිරිසේ යම් සාමාජිකයකු අදහස් වේ;

"මගී නෞකාව" යන්නෙන්, 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ (SOLAS) අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ මගී නෞකාවක් අදහස් වේ;

"ප්‍රචාලන බලය" යන්නෙන්, නෞකාවේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ වෙනත් නිල ලේඛනයක හෝ දැක්වෙන, නෞකාවක සියලුම ප්‍රධාන ප්‍රචාලන යන්ත්‍රවලට අයත්, කිලෝ වොට් මගින් දැක්වෙන, මුළු උපරිම අඛණ්ඩ සීඝ්‍රතා ප්‍රතිදාන බලය අදහස් වේ;

"ගුවන් විදුලි ක්‍රියාකරු" යන්නෙන්, ගුවන් විදුලි නියෝගවල විධිවිධාන යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන හෝ පිළිගනු ලබන උචිත සහතිකයක් දරන තැනැත්තකු අදහස් වේ;

"නිල නොලත් නැවියා" යන්නෙන්, නෞකාධිපති හෝ නිලධරයකු හෝ නොවන නෞකාවක නාවික පිරිසේ යම් සාමාජිකයකු අදහස් වේ;

"සීමා කරන ලද GMDSS ගුවන් විදුලි ක්‍රියාකරු" යන්නෙන්, විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු ගමන් තුළ පමණක් ක්‍රියාත්මක වීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තකු අදහස් වේ;

"මුහුදු ගමන් සේවය" යන්නෙන්, සහතිකයක් නිකුත් කිරීම හෝ නැවත වලංගු කිරීම හෝ වෙනත් සුදුසුකමක් හෝ සම්බන්ධයෙන් අදාළ වන, මුහුදු ගමන් නෞකාවක නෞකාස්ථ සේවය අදහස් වේ;

"මුහුදු ගමන් නෞකාව" යන්නෙන්, රට අභ්‍යන්තර ජලාශයන්ට සීමා වී හෝ ආරක්ෂිත ජලාශ හෝ වරාය නියෝග අදාළ වන ප්‍රදේශ ඇතුළත හෝ ඒවාට තදාසන්න වූ ජලාශවලට සීමා වී යාත්‍රාකරණයෙහි යෙදෙන නෞකාවක් නොවන්නා වූ වෙනත් වාණිජ නෞකාවක් අදහස් වේ;

"දෙවන ඉංජිනේරු නිලධරයා" යන්නෙන්, නිලයෙන් ප්‍රධාන ඉංජිනේරු නිලධරයාට සමීපතම පහළ නිලය දරන සහ ප්‍රධාන ඉංජිනේරු නිලධරයාගේ අශක්නුතාවක දී නෞකාවේ යාන්ත්‍රික ප්‍රචාලනය සහ යාන්ත්‍රික සහ විදුලි සවි කිරීම පිළිබඳ ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව සම්බන්ධයෙන් වගකීම පැවරෙන ඉංජිනේරු නිලධරයා අදහස් වේ;

"ටග් යාත්‍රාව" යන්නෙන්, බඩු සඳහා සුළු ඉඩ ප්‍රමාණයක් ඇති හෝ එවැනි ඉඩ ප්‍රමාණයක්වත් නොමැති වූ ද, වරාය, ගංගා, තටාකවලින් හෝ ඒවායින් පිටතට මුහුදේ ඇති නෞකා ඇදගෙන ඒම හෝ එම නෞකාවලට සහායවීම සඳහා හෝ බත්තල්, පාරු හෝ වෙනත් කුඩා යාත්‍රා ඇදගෙනයාම හෝ තල්ලු කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන්නාවූ ද, යාන්ත්‍රිකව ප්‍රචාලනය කරනු ලබන නෞකාවක් අදහස් වේ;

### I වන උපලේඛනය

[3(2) වන නියෝගය]

| *I වන තීරය*<br>*සහතික පන්තිය* | *II වන තීරය*<br>*ප්‍රදේශ සීමාව* | *III වන තීරය*<br>*ටොන් ප්‍රමාණයේ සීමාව* |
|---|---|---|
| දේශීය මුහුදු ගමන් - යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් පන්සියයට අඩු |
| දේශීය මුහුදු ගමන් - නෞකාධිපති | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් පන්සියයට අඩු |
| දේශීය මුහුදු ගමන් - යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් පන්සියයට අඩු |
| දේශීය මුහුදු ගමන් - ප්‍රධාන උප නැව්පති | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - නෞකාධිපතිවරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රා උප නැව්පති | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රා නෞකාධිපතිවරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් පන්සියයට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රා | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් පන්සියයට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රා උප නැව්පති | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රා නෞකාධිපති | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියා | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් අසූව සිට දළ ටොන් තුන්දහස දක්වා |
| දේශීය මුහුදු ගමන් - සමත් මුහුදු යාත්‍රාකරු - නැව් තට්ටු | 0R, 1, 2, 3, 4 සහ 5 | දළ ටොන් අසූව සිට දළ ටොන් තුන්දහස දක්වා |

**II වන උපලේඛනය**

(3(3) වන නියෝගය)

| *I වන තීරය*<br>*සහතික පන්තිය* | *II වන තීරය*<br>*ප්‍රදේශ සීමාව* | *III වන තීරය*<br>*ප්‍රචාලන බලයේ සීමාව* |
|---|---|---|
| දේශීය මුහුදු ගමන් - කිලෝ වොට් හත්සිය පනහට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හත්සිය පනහට අඩු |
| දේශීය මුහුදු ගමන් - කිලෝ වොට් හත්සිය පනහට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හත්සිය පනහට අඩු |
| දේශීය මුහුදු ගමන් - කිලෝ වොට් තුන්දහසට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - දෙවන ඉංජිනේරු නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - කිලෝ වොට් තුන්දහසට අඩු ප්‍රචාලන බලයක් සහිත නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් තුන්දහසට අඩු |
| ටග් යාත්‍රාවල සමුද්‍රීය ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හයදහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රාවල දෙවන ඉංජිනේරු නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හයදහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - ටග් යාත්‍රාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හයදහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - ඉංජිනේරු මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හත්සිය පනහට අඩු |
| දේශීය මුහුදු ගමන් - සමත් මුහුදු යාත්‍රාකරු ඇංජින් කාමර | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් හත්සිය පනහට අඩු |
| දේශීය මුහුදු ගමන් - ඉංජිනේරු මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - සමත් මුහුදු යාත්‍රාකරු ඇංජින් කාමර | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් තුන්දහසට අඩු |
| දේශීය මුහුදු ගමන් - විද්‍යුත් නිල නොලත් නැවියා | 0R, 1, 2, 3, 4 සහ 5 | කිලෝ වොට් තුන්දහසට අඩු |

## III වන උපලේඛනය

### "අ" කොටස

[2(4) වන නියෝගය]

*කර්තව්‍ය*

(*අ*) යාත්‍රාකරණය;

(*ආ*) නැව්බඩු එහා මෙහා කිරීම සහ තබා ගැනීම;

(*ඇ*) නැවේ ක්‍රියාකාරීත්වය පාලනය කිරීම සහ නෞකාස්ථ තැනැත්තන්ගේ ආරක්ෂාව;

(*ඈ*) සමුද්‍ර ඉංජිනේරු ශිල්පය;

(*ඉ*) විද්‍යුත්, ඉලෙක්ට්‍රොනික සහ පාලන ඉංජිනේරු ශිල්පය;

(*ඊ*) නඩත්තුව සහ පිළිසකර කිරීම; සහ

(*උ*) ගුවන් විදුලි සන්නිවේදන.

### "ආ" කොටස

*වගකීම් මට්ටම*

(*අ*) කළමනාකරණ මට්ටම (නෞකාධිපතිවරයා, ප්‍රධාන උප නැව්පති, ප්‍රධාන ඉංජිනේරු නිලධරයා සහ දෙවන ඉංජිනේරු නිලධරයා).

(*ආ*) මෙහෙයුම් මට්ටම (යාත්‍රාකරණ මුරකාවලක කාර්යභාර නිලධරයා, ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධරයා, විද්‍යුත්-කාර්මික නිලධරයා සහ ගුවන් විදුලි ක්‍රියාකරු).

(*ඇ*) සහායක මට්ටම (සමත් මුහුදු යාත්‍රාකරු - නැව් තට්ටු , සමත් මුහුදු යාත්‍රාකරු - ඇංජින් කාමර, විද්‍යුත්-කාර්මික නිල නොලත් නැවියා සහ මුරකාවලෙහි යෙදී සිටින නිල නොලත් නැවියා).

EOG - 01-0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.